# සංක්ෂිප්තය

ග්‍රාමීය සුළු ගොවීන්ගේ ඉතිරි කිරීම් හැකියාව වර්ධනය කිරීම හා ආයෝජන ණය අවශ්‍යතා සැපිරීම මූලික වශයෙන් අරමුණු කොට ගනිමින් 1998 දී ගොවි බැංකු නියමු ව්‍යාපෘතිය ස්ථාපිත කරනු ලැබිණි. මේ යටතේ ඒ ඒ ප්‍රදේශවල ගොවීන්ගේ ණය අවශ්‍යතා එම ප්‍රදේශවල ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන පදනම් කර ගනිමින් පිහිටවනු ලබන ගොවිජන බැංකු මඟින් ලබාදීමට අපේක්ෂා කෙරිණි. ඒවායේ පාලනය ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා විවිධ මට්ටම්වල එකිනෙකට වෙනස් බලතල හා වගකීම් සහිතව පිහිටවනු ලැබූ කමිටු පහක් මඟින් සිදු කෙරේ. එමඟින් වගාව, අස්වනු නෙළීම, අස්වනු රැස්කිරීම, යන්ත්‍ර සූත්‍ර මිල දී ගැනීම, කෘෂි ව්‍යාපෘති ඇරඹීම හා ගොවි විශ්‍රාම වැටුපට දායකවීම යනා දී කාරණා වෙනුවෙන් වූ ණය වර්ග හයක් ක්‍රියාත්මක කෙරේ. ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමෝපායය යටතේ සපයනු ලබන මෙම ණය ලබාගැනීම සඳහා ඒවා ආපසු ගෙවීම සම්බන්ධයෙන් සාමූහිකව වගකීම භාරගනු ලබන කුඩා කණ්ඩායම් හි සාමාජිකයින් ලෙස ගොවි බැංකුවට බැඳිය යුතු ය. වැඩසටහනෙහි කාර්ය සාධන මට්ටම හා ඒ සඳහා බලපෑ හේතූන් විමර්ශනය සඳහා ප්‍රමාණවත් තරම් අධ්‍යයන සිදු කෙරී නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් ඇති තොරතුරුවල හිඳැස පිරවීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ග්‍රාමීය ගොවීන්ගේ ණය අවශ්‍යතා සැපිරීම සඳහා ගොවිජන බැංකුව කොතෙක් දුරට සමත් ව සිටීද? යන්න සොයා බැලීම මෙහි ප්‍රධාන අරමුණ විය. විවිධ තත්ත්වයන් නියෝජනය කරමින් තෝරාගත් දිස්ත්‍රික්ක පහකට අයත් ඉතා සාර්ථක හා සාමාන්‍ය මට්ටමෙන් ක්‍රියාත්මක ගොවි බැංකු දහයක් පදනම් කරගත් සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය මේ සඳහා භාවිතා කරන ලදී.

ගොවි බැංකුවල දිගුකාලීන කාර්ය සාධනය විමසීමේ දී ඒවායේ සාමාජිකයන් ප්‍රමාණය, ඉතිරි කිරීම්, ණය ලබාදීම යනාදියේ අඩුවීමක් ද, ණය අයකර ගැනීමේ වර්ධනයක් ද (95%ක) දැකිය හැකි ය. බොහෝ ගොවීන් (70%- 80%) ගොවි බැංකුවට බැඳී නොමැති අතර එමඟින් දෙන ණය ප්‍රමාණය (වී වගාව සඳහා අක්කරයකට රු. 5000 සහ සියලු බෝග සඳහා උපරිම ණය සීමාව රු. 25,000 ලෙස) ප්‍රමාණවත් නොවීම (30%), එහි සේවා හා ප්‍රතිලාභ පිළිබඳ අඩු දැනුම (28%) සහ ණය ලබා ගැනීමට ඇති බිය (15%) යනා දී කරුණු එයට බලපා තිබේ. ඇතැම් කණ්ඩායම් සාමාජිකයින් ලබාගත් ණය නො ගෙවීමෙන් එම කණ්ඩායමේ හි අන් අයට දිගටම ණය ලබාගැනීම සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති වන නිසා එහි ඇති කණ්ඩායම් ණය ක්‍රමයට ඇතැම් ගොවීහු (37%) අකමැත්ත දැක්වූ හ. හුදකලා ගම්වල වෙසෙන ගොවීහු ද්‍රව්‍ය ණය ලබාදීම පිළිබඳව අගය කළ අතර ඒ සඳහා ඇති පොළිය වඩාත් වැඩි නිසා අනෙක් ගොවීන්ගෙන් විශාල ප්‍රමාණයක් (47%) ඒ සඳහා අකමැත්ත දැක්වූ හ. කඩිනමින් හා පහසුවෙන් ලබාගත නො හැකි නිසා ගොවීන් මෙන් ම ගොවි සංවිධාන ද සැලකිය යුතු ලෙස ගොවි බැංකුවේ හි ඉතිරි කිරීමට පෙළඹී නොමැත. මෙවන් ගැටලු පැවතිය ද, සීමිත ගොවි බැංකු සංඛ්‍යාවක් ඉතුරුම් සඳහා පෙළඹවීම මෙන් ම ණය ලබාදීම හා අයකිරීම අතින් වඩාත් හොඳ ප්‍රගතියක් පෙන්වා තිබේ. ඒ සඳහා ප්‍රාදේශීය නිලධාරී ඇතුළු පරිපාලනය සම්බන්ධ වූ අයගේ පරිපාලන දක්ෂතාව හා කැපවීම මෙන් ම ප්‍රදේශයේ සමාජ-ආර්ථික තත්ත්වය ද හේතු වී ඇත. සාමාන්‍යයෙන් ගොවි බැංකුවෙන් වඩාත් ප්‍රයෝජන ගන්නා අයගෙන් වැඩිදෙනෙකු ණය හා අනෙකුත් යෙදවුම් වන බීජ හා කෘෂි රසායනික වෙත පහසුවෙන් ළඟාවීමට නොහැකි දුෂ්කර ප්‍රදේශවල වෙසෙන දුප්පත් ගොවීන් ය. කණ්ඩායම් ණය ක්‍රමය යටතේ මෙම සේවා ඔවුන්ගේ ගම් වෙත සැපයීම ඔවුන්ට මහත් ප්‍රයෝජනවත් වේ.

සුළු ගොවීන්ගේ ණය අවශ්‍යතා සැපිරීම සඳහා ගොවිජන බැංකුවට ඉහළ හැකියාවක් පවතින බැවින් ඈත ගම්වල වෙසෙන දුප්පත් ගොවීන්ට වැඩි වශයෙන් සීමා වූ එහි සේවා අනෙක් ගොවීන් වෙතට ද ව්‍යාප්ත කළ යුතු ය යන්න නිගමනය විය.

අධ්‍යයනයේ නිර්දේශ අතර ගොවි බැංකුව හා එහි ප්‍රයෝජන පිළිබඳව දැනුවත් කොට සාමාජිකත්වය වැඩි කිරීම, ඉක්මනින් හා පහසුවෙන් ඉතුරුම් ආපසු ලබාගැනීමට සැලැස්වීම, ඒ ඒ බෝගයට හා ප්‍රදේශයට ගැළපෙන ලෙස ලබාදෙන ණය ප්‍රමාණය වැඩි කිරීම, ප්‍රමාණවත් මුදලක් ඉඩම් සකසීම සඳහා ලබාදීම හා සියලු ගොවි බැංකුවලට එකවර මිල දී ගැනීමෙන් කෘමිනාශක සඳහා ඉහළ කොමිස් ලබාදීම, පුහුණු වැඩසටහන් ආශ්‍රයෙන් කණ්ඩායම් සාමාජිකයින් අතර සාමූහික හැඟීම් වර්ධනය සඳහා කටයුතු සැලසීම, ණය ලබාදීමේ දී කණ්ඩායම් ක්‍රමයට අමතරව ඔප්පුවක් වැනි පුද්ගලික ඇපයක් මත ණය ලබාගැනීමට අවස්ථාව ලබාදීම ඒ අතර විය.